**කෝරළේපත්තු ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 19 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කෝරළේපත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුවේ. | පිළිගනිමි |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පාඨකයින් විසින් ආපසු භාර නොදුන් රු.391,801 ක් වටිනා පොත් 3139 න් විනාශ වූ පොත් 1912 ක් වටිනාකම තක්සේරු කර අවසාන පොත් තොග ශේෂයෙන් අඩුනොකර වත්කම් ලෙස දක්වා තිබුණි. | ආපසු භාර නොදුන් සියලු පොත්වල අගය තක්සේරු කර අවසන් පොත් තොගයෙන් අඩුකර ඉදිරිපත් කළ යුතුය. | පිළිගනිමි. |

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් ලෙස ගෙවා තිබුණු රු.949,991 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ආ) | සංචාරක හෝටල් 09 කින් අයකළ යුතු ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගාස්තු රු. 435,000 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**1.4 අනුකූල නොවීම්**

**නිතී, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නිතී, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූළ නොවූ අවස්ථා පහතින දක්වා ඇත.

| නිතී, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 1645 සහ 1646 | සභාව විසින් භාවිතා කරනු ලබන වාහන ධාවන සටහන් සහ මාසික සාරාංශ විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. | මාසිකව විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වේ. | පිළිගනිමි |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,337,224 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,573,659 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලොචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ විස්තර පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස් කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස් කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 10,300,000 | 402,100 | 402,100 | - | 16,672,000 | 525,790 | 525,790 | - |
| කුලී | 16,007,000 | 6,931,985 | 6,931,985 | 13,498,226 | 14,345,000 | 5,771,622 | 5,771,622 | 13,161,830 |
| බලපත්‍ර ගාස්තු | 3,367,500 | 4,461,956 | 4,461,956 | - | 3,331,000 | 4,355,260 | 4,355,260 | - |
| අනෙකුත් ආදායම් | 26,899,000 | 20,983,612 | 20,983,612 | 340,000 | 25,634,000 | 111,105,685 | 10,935,353 | 435,000 |
| එකතුව | **56,573,500** | **32,779,653** | **32,779,653** | **13,838,226** | **59,982,000** | **133,603,017** | **120,006,187** | **13,596,830** |

### 2.2.2 ආදායම් රැස්කිරිමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **කඩ කුලී** | | |
| කඩ කුලී, වෙළඳපොල කුලී, ඉඩම් බදු දීම් හා JCB යන්ත්‍ර කුලියට දීම් එකතුව රු. 1,317,150 ක් අයකර ගැනීමකින් තොරව හිඟහිටව පැවතුණි. | හිඟ මුදල් අයකිරීමට කඩිනම් පියවර ගත යුතු වේ. | පිළිගනිමි |
| (ආ) **බලපත්‍ර ගාස්තු** | | |
| රැස්කළ ප්‍රමාණය, බිල්කළ ආදායම් ලෙස දැක්වීම හේතුවෙන් හිඟහිටි කිසිවක් නොපැවැතුණි. | හිඟ මුදල් අයකිරීමට කඩිනම් පියවර ගත යුතු වේ. | පිළිගනිමි |
| (ඇ) **උසාවි දඩ ගාස්තු සහ මුද්දර ගාස්තු** | | |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරින්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ ගාස්තු සහ මුද්දර ගාස්තු ලැබිය යුතුව පැවතුණි. | උසාවි දඩ ගාස්තු සහ මුද්දර ගාස්තු ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) කාර්යභාරයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්** | | |
| 2017 වර්ෂයේ කලෙයිවානි මාර්ගයත්, විපුලානන්ද මාර්ගයත් සම්බන්ධ කිරීමේ මාර්ගය කානු පද්ධතිය සමඟ ඉදිකිරීම සඳහා සලසා තිබූ රු.මිලියන 02 ක ප්‍රතිපාදන 2020 මාර්තු 31 දින වන විටත්, මාර්ග ඉදිකිරීම සඳහා ක්‍රියාමාර්ග නොගෙන එම මුදල් සුළු ණය ගිණුමේ ගිණුම්ගත කර තිබුණි. | සලසා තිබූ ප්‍රතිපාදන අදාළ අරමුණු සඳහා උපයෝජනය කළ යුතු වේ. | පිළිගනිමි |
| **(ආ) තිරසාර සංවර්ධන අරමුණු** | | |
| 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනීම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනීම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කළ සංචාරක නිකේතනවලින් ඒවායේ මුළු ආදායමින් 1 % ක ගාස්තු අයකරළ යුතු වුවත්, ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කළ පාසිකුඩා ප්‍රදේශයේ ක්‍රියාත්මකව පවතින සුපිරි හෝටල් 14කින් අයකර ගත යුතු ගාස්තු වර්ෂ 10 ක සිට අයකරගෙන නොතිබුණි. | ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1993 වර්ෂයේ සිට මාර්ගය අයිනේ වූ කඩකාමර 25 ක්, පොදු වෙළෙඳ පොළ කඩකාමර 27 ක්, කුකුල් මස් කඩ 10 ක්, දසදෙනෙකුගෙන් අයවිය යුතු පාසිකුඩා වාහන නැවතුම් කුලී ගාස්තු, හය දෙනෙකුගෙන් ලැබිය යුතු සංස්කෘතික මධ්‍යස්ථාන ගාස්තු සහ පුද්ගලයින් තිස්දෙනෙකුගෙන් අයකළ යුතු කුලී හා බදු මුදල් හිඟ රු.12,181,066 ක් අයකර ගැනීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හෝ සභාව විසින් කටයුතු කර නොතිබුණි. | කඩකාමර කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. නැතහොත් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | පිළිගනිමි |
| (ඇ) | සභාවේ සමාලෝචිත වර්ෂයේ ජංගම බැංකු ගිණුම පවත්වාගෙන යනු ලබන මුදල් පොත අනුව, රු. මිලියන 25 සිට රු. මිලියන 30 දක්වා පරාසයකින් අතැති මුදල් තිබූ නමුත් එය ඵලදායී ආකාරයෙන් ආයෝජනය කර ආදායම් ඉපැයීමට කටයුතු නොකිරීම නිසා සභාව විසින් ආසන්න වශයෙන් රු. මිලියන 02 ක ආදායමක් අහිමි වී තිබුණි. | නියමිත අතැති මුදල් ශේෂය පවත්වාගෙන ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවකයන් 66 දෙනෙකු අනුමත සේවක සංඛ්‍යාවට අතිරේකව දක්නට ලැබුණි. | අනුමැතීන් සහිතව කාර්යය මණ්ඩලය බඳවා ගත යුතුවේ. | පිළිගනිමි |
| (ආ) | වර්ෂ 05 කට පෙර සේවය අත්හැර ගිය සේවකයන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 221,952 ක හිඟ ණය අදාළ පුද්ගලයින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල ණය මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 නඩත්තුව සහ අලුත්වැඩියාවන් සිදු කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අංක JZ-8145 දරන ජල බවුසරයේ ටැංකිය පළුදු වී වර්ෂ 02 කට අධික කාලයක සිට අලුත්වැඩියා කිරීමකින් තොරව පැවතුණි. | අලුත්වැඩියා කර භාවිතයට ගත යුතුවේ. | පිළිගනිමි |

### 3.4.2 වාහන භාවිතා කිරීම

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ඉන්ධන ලීටරයකට වාහනය ධාවනය කළ හැකි දුර යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් වාර්ෂිකව පරීක්ෂා කළ යුතු බව රාජ්‍ය පරිපාලන කළමනාකරණ අමාත්‍යාංශයේ 2016.12.29 දිනැති අංක (EST-6/T PORT/05/3515 30/2016 දරන චක්‍රලේඛය අනුව සඳහන් වුවත් එයට අනුකූලව සිදුකර නොතිබුණි. | මාස 06 කට වරක් පරීක්ෂා කළ යුතු වේ. | පිළිගනිමි |
| (ආ) | වාහන 08 ක් සඳහා මෝටර් රථ ලියාපදිංචි කිරීමේ පනතට අනුව ලියාපදිංචි සහතික ලබාගෙන නොතිබුණි. | ලියාපදිංචි සහතික ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි |
| (ඇ) | වාහන 07 කට වාහන ප්‍රවාහන බලපත්‍ර (Revenue Licence) නොතිබුණි. | වාහන ප්‍රවාහන බලපත්‍ර (Revenue Licence) ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි |
| (ඈ) | භාවිතා කළ නොහැකි වාහන 07 ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | භාවිතා කළ නොහැකි වාහන සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පිළිගනිමි |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර එයට අනුව මිලදී ගැනීම් සිදුකර නොතිබුණි. | වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී පිළියෙල කරනු ලැබේ. |

**3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් ඉඩමෙහි නව වෙළඳපොල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2016 ඔක්තෝබර් 15 දින ගිවිසුම් අත්සන කර තිබුණි. එසේ වුවත් කොන්ත්‍රාත්කරු විසින් අදාල ඉඩමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර රු.924,053 ක් වටිනා කාර්යයන් අවසන් වීමෙන් පසුව වෙනත් පුද්ගලයෙකු විසින් නීති විරෝධී ආකාරයෙන් අයිතිවාසිකම් පෑම නිසා ඉදිකිරීම් කටයුතු කොන්ත්‍රාත්කරු විසින් අත්හැර දමා තිබුණි. එසේ වුවත්, සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ගයන් ගෙන ඉඩම අත්පත් කර කාර්යයන් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අ දැක්වීම |
|---|---|---|
| අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කළ යුතුවේ. | ක්‍රියාමාර්ග ගෙන ඇත |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කාර්තුවකට වරක් හෝ පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී කිසිදු කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවත්විය යුතුවේ. | ක්‍රියාමාර්ග ගෙන ඇත. |